## ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය

# පුරප්පාඩු

## ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල වෙත සුදුසුකම්ලත් අයවලුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ

- **පූර්ණ කාලීන ස්ථිර පදනම මත**

## 1. වෛද්‍ය නිලධාරි

**1. වෛද්‍ය නිලධාරි - I ශ්‍රේණිය**

**සුදුසුකම්:**

වෛද්‍යවරයෙකු ලෙස සේවය කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ වලංගු පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම.

සහ

සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතනයක හෝ සෞඛ්‍ය අමාත්‍යාංශයේ පුද්ගලික වෛද්‍ය සේවා නියාමන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචිය ලබා ඇති, පුද්ගලික රෝහල්, සාත්තු නිවාස සහ මාතෘ නිවාස යන කාණ්ඩ යටතේ ක්‍රියාත්මක වන ආයතනවල II ශ්‍රේණිය වෛද්‍ය නිලධාරියෙකු ලෙස අවම වශයෙන් වසර හයක (06) පළපුරුද්ද ලබා තිබීම.

සහ

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් 11.10.2014 දින නිකුත් කරන ලද 1883/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ II වන ඇමුණුම යටතේ පිළිගත් පශ්චාත් වෛද්‍ය උපාධියක් ලබා තිබීම.

සහ

ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් නිකුත් කරන ලද "Certificate of Good Standing" ලබා තිබීම.

**වයස් සීමාව:**

අවුරුදු 25 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය:**

MO 1-1 රු.(101,610 - 3 × 2,480 - 7 × 2,490 - 2 × 3,450 - 10 × 4,100 - 174,380)

*වෛද්‍ය නිලධාරි – I ශ්‍රේණිය MO 1-1 පියවර 14 හි තබනු ලැබේ රු.137,480.00 + අනුමත අනෙකුත් දීමනා.

**2. වෛද්‍ය නිලධාරි - II ශ්‍රේණිය**

**සුදුසුකම්:**

වෛද්‍යවරයෙකු ලෙස සේවය කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ වලංගු පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම.



Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

සහ

සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතනයක හෝ සෞඛ්‍ය අමාත්‍යාංශයේ පුද්ගලික වෛද්‍ය සේවා නියාමන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචිය ලබා ඇති පුද්ගලික රෝහල්, සාත්තු නිවාස සහ මාතෘ නිවාස යන කාණ්ඩ යටතේ ක්‍රියාත්මක වන රෝහලක අවම වශයෙන් වසර දෙකක (02) පළපුරුද්ද ලබා තිබීම.

සහ

ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් නිකුත් කරන ලද "Certificate of Good Standing" ලබා තිබීම.

**වයස් සීමාව:**

අවුරුදු 25 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය:**

MO 1-1 රු.(101,610 - 3 × 2,480 - 7 × 2,490 - 2 × 3,450 - 10 × 4,100 - 174,380)

*වෛද්‍ය නිලධාරි – II ශ්‍රේණිය MO 1-1 පියවර 05 හි තබනු ලැබේ.රු.111,540.00 + අනුමත අනෙකුත් දීමනා.

**3. වෛද්‍ය නිලධාරි - ප්‍රාථමික ශ්‍රේණිය**

**සුදුසුකම්:**

වෛද්‍යවරයෙකු ලෙස සේවය කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ වලංගු පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම.

සහ

ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් නිකුත් කරන ලද "Certificate of Good Standing" ලබා තිබීම.

**වයස් සීමාව:**

අවුරුදු 25 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය:**

MO 1-1 රු.(101,610 - 3 × 2,480 - 7 × 2,490 - 2 × 3,450 - 10 × 4,100 - 174,380)

* වෛද්‍ය නිලධාරි – ප්‍රාථමික ශ්‍රේණිය MO 1-1 පියවර 02 හි තබනු ලැබේ - රු. 104,090.00 + අනුමත අනෙකුත් දීමනා.

## 2. හෙද පාලිකා තනතුර

**සුදුසුකම්:**

විශේෂ ශ්‍රේණියේ නිලධරයෙකු වීම.

සහ

ජාතික හෙද අධ්‍යාපන ආයතනය/ පශ්චාත් ප්‍රාථමික හෙද විද්‍යාල විසින් පවත්වනු ලබන වාට්ටු කළමණාකරණය හා අධීක්ෂණය/ ඉගැන්වීම හා අධීක්ෂණය/ මහජන සෞඛ්‍ය හෙදකම හා වින්නඹු කර්මය/ මානසික හෙදකම අඩංගු අවුරුදු 1 1/2 ක ඩිප්ලෝමා පාඨමාලාව හදාරා I වන ශ්‍රේණියේ හෙද නිලධාරි (රෝහල් සේවා, අධ්‍යාපන, මහජන සෞඛ්‍ය) තනතුරක වසර පහක (05) සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.



Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

සහ

තෙවැනි කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කර තිබීම.

සහ

පූර්වාසන්නතම වසර පහ (05) තුළ නියමිත වැටුප් වර්ධක සියල්ලම උපයාගෙන තිබීම හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

සහ

අනුමත කාර්යසාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර පහක් (05) තුළ සතුටුදායක මට්ටමට වඩා ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.

**වයස් සීමාව:**

අවුරුදු 25 ට නොඅඩු හා අවුරුදු 52 ට නොවැඩි අය විය යුතුය.

**වැටුප් පරිමාණය:**

MT 8 පියවර 04 රු. (87,800 – 10 x 2,490 – 3,450 x 8 - 140,300) හි තබනු ලැබේ.

## 3. හෙද නිලධාරි තනතුර

**සුදුසුකම්:**

සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශය මගින් හෝ හෙද සභාව පිළිගත් විශ්වවිද්‍යාලයක හෙද ඩිප්ලෝමා පාඨමාලාව හෝ උපාධිය සම්පූර්ණ කර තිබීම.

සහ

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී විද්‍යා විෂය ධාරාවට අයත්, ජීව විද්‍යාව/ගණිතය/කෘෂි විද්‍යාව විෂය ධාරාවෙන් සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත් වීම. පැරණි විෂයය නිර්දේශය යටතේ විෂයයන් තුනකින් (03) එකවර සමත්වීම.

සහ

සිංහල / දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව හා ඉංග්‍රීසි යන විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

**වයස් සීමාව:**

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය:**

MT 7 - රු.(55,910 - 10 × 800 - 11 × 1,190 - 10 ×1,320 - 10 × 1,350 -103,700)

*හෙද නිලධාරි – III ශ්‍රේණිය MT 7 පියවර 01 හි තබනු ලැබේ. - රු. 55,910.00 + අනුමත අනෙකුත් දීමනා.



Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

## 4. විකිරණ ශිල්පී (රෝග විනිශ්චය) තනතුර

**සුදුසුකම්:**

සිංහල/ දෙමළ, ගණිතය සහ විද්‍යාව ඇතුළු විෂයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව එක් වරකදී විෂයයන් හයකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම සහ දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව සමත් වීම.

සහ

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් භෞතික විද්‍යාව විෂයට සම්මාන සාමාර්ථයක් සහිතව සංයුක්ත ගණිතය, ජීව විද්‍යාව, රසායන විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් එකවර සමත් වීම.

සහ

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රධානය කිරීමේ ආයතනයක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් මගින් හෝ විකිරණ ප්‍රතිකාරකවේදී/ විකිරණ විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම.

හෝ

සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් මෙහෙයවනු ලබන විකිරණ ශිල්පී දෑ අවුරුදු ඩිප්ලෝමා පුහුණු පාඨමාලාව සමත්ව තිබීම.

සහ

විකිරණ ශිල්පියෙකු ලෙස ශ්‍රී ලංකාව තුළ කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබීම.

හෝ

විදේශීය උපාධියක් ලබා ඇති අයෙක් නම් විකිරණ ශිල්පියෙකු ලෙස ශ්‍රී ලංකාව තුළ කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

**වයස් සීමාව:**

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය.

**වැටුප් පරිමාණය:**

MT 6 පියවර 01 රු. (55,110 – (10 x 800 – 11 x 1,190 – 10 x 1,320 - 10 x 1,350 – 102,900) හි තබනු ලැබේ.

## 5. ඖෂධවේදී තනතුර

**සුදුසුකම්:**

I. සිංහල භාෂාව/ දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව ඇතුළුව විෂයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව එක් වරකදී විෂයයන් හයකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම සහ දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව සමත් වීම.

සහ

II. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් රසායන විද්‍යාව විෂයට සම්මාන සාමාර්ථයක් සහිතව සංයුක්ත ගණිතය, ජීව විද්‍යාව, භෞතික විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් සමත් වීම.

සහ



Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

III. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රධානය කිරීමේ ආයතනයක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් මගින් හෝ ඖෂධවේදී/ විද්‍යාවේදී (ඖෂධවේදී) උපාධියක් ලබා තිබීම.

හෝ

IV. සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් මෙහෙයවනු ලබන ඖෂධවේදී දෑ අවුරුදු පූර්ණ කාලීන ඩිප්ලෝමා පුහුණු පාඨමාලාව සමත්ව තිබීම.

සහ

V. ඖෂධවේදියෙකු ලෙස ශ්‍රී ලංකාව තුළ කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබීම.

හෝ

VI. විදේශීය උපාධියක් ලබා ඇති අයෙක් නම් ඖෂධවේදියෙකු ලෙස ශ්‍රී ලංකාව තුළ කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

**වයස් සීමාව:**

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය.

**වැටුප් පරිමාණය:**

MT 6 - රු. (55,110 – (10 x 800 – 11 x 1,190 – 10 x 1,320 - 10 x 1,350 – 102,900)

*MT 6 පියවර 01 හි (රු.55,110/-) තබනු ලැබේ.

## 6. භෞත චිකිත්සක තනතුර

**සුදුසුකම්:**

සිංහල/ දෙමළ, ගණිතය, විද්‍යාව ඇතුලුව විෂයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව එක් වරකදී විෂයයන් හයකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම සහ දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව සමත් වීම.

සහ

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් භෞතික විද්‍යාව විෂයට සම්මාන සාමාර්ථයක් සහිතව සංයුක්ත ගණිතය, ජීව විද්‍යාව, රසායන විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් එකවර සමත් වීම.

සහ

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රධානය කිරීමේ ආයතනයක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් මගින් හෝ භෞත චිකිත්සකවේදී උපාධියක් ලබා තිබීම.

හෝ

සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් මෙහෙයවනු ලබන දෑ අවුරුදු භෞත චිකිත්සක ඩිප්ලෝමා පුහුණු පාඨමාලාව සමත්ව තිබීම.

සහ

භෞත චිකිත්සකවරයෙකු ලෙස ශ්‍රී ලංකාව තුළ කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබීම.

හෝ

විදේශීය උපාධියක් ලබා ඇති අයෙක් නම් භෞත චිකිත්සකයෙකු ලෙස ශ්‍රී ලංකාව තුළ කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබිය යුතුය.



Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

**වයස් සීමාව:**

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය.

**වැටුප් පරිමාණය:**

MT 6 පියවර 01 රු. (55,110 – (10 x 800 – 11 x 1,190 – 10 x 1,320 - 10 x 1,350 – 102,900) හි තබනු ලැබේ.

## 7. වෘත්තීය චිකිත්සකවේදී තනතුර

**සුදුසුකම:**

සිංහල භාෂාව/ දෙමළ භාෂාව, ගණිතය සහ විද්‍යාව ඇතුලුව විෂයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව එක් වරකදී විෂයයන් හයකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම සහ දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව සමත් වීම

සහ

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් භෞතික විද්‍යාව විෂයට සම්මාන සාමාර්ථයක් සහිතව සංයුක්ත ගණිතය, ජීව විද්‍යාව, රසායන විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් එකවර සමත් වීම

සහ

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරිමේ ආයතනයක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් මගින් හෝ වෘත්තීය චිකිත්සකවේදී උපාධියක් ලබා තිබීම

හෝ

සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් මෙහෙයවනු ලබන දෑ අවුරුදු වෘත්තීය චිකිත්සකවේදී ඩිප්ලෝමා පුහුණු පාඨමාලාව සමත්ව තිබීම

සහ

වෘත්තීය චිකිත්සකවේදීයෙකු ලෙස ශ්‍රී ලංකාව තුළ කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබීම

හෝ

විදේශීය උපාධියක් ලබා ඇති අයෙක් නම් වෘත්තීය චිකිත්සකවේදීයෙකු ලෙස ශ්‍රී ලංකාව තුළ කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

**වයස් සීමාව:**

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය.

**වැටුප් පරිමාණය:**

MT 6 පියවර 01 රු. (55,110 – (10 x 800 – 11 x 1,190 – 10 x 1,320 - 10 x 1,350 – 102,900) හි තබනු ලැබේ.



Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

## 8. අක්ෂි තාක්ෂණවේදී තනතුර

**සුදුසුකම:**

සිංහල භාෂාව/ දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථ සහිතව ඉංග්‍රීසි භාෂාව ද ඇතුලුව විෂයයන් හයකින් දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම.

සහ

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් විද්‍යා විෂය ධාරාවෙන් භෞතික විද්‍යාව විෂයට සම්මාන සාමාර්ථයක් සහිතව ජීව විද්‍යාව, රසායන විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් එකවර සමත් වීම.

සහ

සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් මෙහෙයවනු ලබන අක්ෂි තාක්ෂණවේදී දෑ අවුරුදු පූර්ණ කාලීන ඩිප්ලෝමා පුහුණු පාඨමාලාව සමත්ව තිබීම.

සහ

අක්ෂි තාක්ෂණවේදියෙකු ලෙස ශ්‍රී ලංකාව තුළ කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබීම.

හෝ

විදේශීය උපාධියක් ලබා ඇති අයෙක් නම් අක්ෂි තාක්ෂණවේදියෙකු ලෙස ශ්‍රී ලංකාව තුළ කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

**වයස් සීමාව:**

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය.

**වැටුප් පරිමාණය:**

MT 6 පියවර 01 රු. (55,110 – (10 x 800 – 11 x1190 – 10 x 1320 - 10 x 1350 – 102,900) හි තබනු ලැබේ.

## 9. සෘජු නේත්‍රඥ තනතුර

**සුදුසුකම:**

අක්ෂි තාක්ෂණවේදී තනතුරෙහි ස්ථිර කරන ලද සේවකයෙකු වීම. අදාළ තනතුරේ II වන ශ්‍රේණියට අයත් කාර්යක්ෂමතා කඩයිම සමත් II වන ශ්‍රේණියේ හෝ ඊට ඉහළ නිලධරයෙකු විය යුතුය. අයදුම්පත් කැඳවන අවසාන දිනට අඛණ්ඩ වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

සහ

ශ්‍රී ලංකා අක්ෂි රෝහල මගින් පවත්වනු ලබන මාස හයක (06) සෘජු නේත්‍රඥ පුහුණුව සම්පූර්ණ කර තිබිය යුතුය.

සහ

ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

**වයස් සීමාව:**

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය.

**වැටුප් පරිමාණය:**

MT 6 පියවර 01 රු. (55,110 – 10 x 800 – 11 x 1190 – 10 x 1320 - 10 x 1350 – 102,900) හි තබනු ලැබේ.

## 10. විද්‍යුත් තිකර්පත රේඛන සටහන්කරු තනතුර

**සුදුසුකම්:**

සිංහල භාෂාව/ දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී ඉංග්‍රීසි භාෂාව ඇතුලුව විෂයයන් හයකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම.

සහ

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් ජීව විද්‍යාව විෂයට සම්මාන සාමාර්ථ සහිතව භෞතික විද්‍යාව, රසායන විද්‍යාව යන විෂයයන් එකවරකදී සමත් වීම.

සහ

සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් මෙහෙයවනු ලබන විද්‍යුත් තිකර්පත රේඛන සටහන්කරු එක් අවුරුදු පූර්ණකාලීන ඩිපලෝමා පුහුණු පාඨමාලාව සමත්ව තිබීම.

**වයස් සීමාව:**

අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය.

**වැටුප් පරිමාණය:**

MT 4 පියවර 01 රු. (53,510 - 10 x 800 - 11 x 1,190 - 10 x 1,320 - 10 x 1,350 – 101,300) හි තබනු ලැබේ.

## 11. පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී තනතුර

**සුදුසුකම්:**

සිංහල/ දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථ සහිතව ඉංග්‍රීසි භාෂාවද ඇතුලුව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් **06** කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම

සහ

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් ජීව විද්‍යාව, භෞතික විද්‍යාව, කෘෂි විද්‍යාව, රසායන විද්‍යාව යන විෂයයන් අතුරින් විෂයයන් තුනක් එක්වරකදී සමත් වීම

සහ

පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී තනතුරෙහි කාර්යභාරයට අදාලව සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශය මඟින් මෙහෙයවනු ලබන වසර එකහමාරක (1 1/2) පූර්ණ කාලීන වෘත්තිමය ඩිප්ලෝමා (අභ්‍යන්තර) පාඨමාලාව සාර්ථකව හදාරා ඩිප්ලෝමා සහතිකය ලබා තිබිය යුතුය

සහ

කාන්තා පක්ෂයට පමණක් අයදුම් කළ හැක.



Gazette.lk AMBITIONS REALIZED

**<u>වයස් සීමාව:</u>**

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය.

**<u>වැටුප් පරිමාණය:</u>**

MT 5 පියවර 01 රු. (54,310 – 10 x 800 – 11 x 1,190 – 10 x 1,320 – 10 x 1,350 - 102,100) හි තබනු ලැබේ.

## 12. ජාල පරිපාලක තනතුර

**<u>සුදුසුකම:</u>**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් පරිගණක ඉංජිනේරු/ පරිගණක විද්‍යාව/ තොරතුරු තාක්ෂණ/ පරිගණක විද්‍යා හා තාක්ෂණ/ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ උපාධියක් ලබා තිබීම.

හෝ

තෘතියහ ා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තිය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තිය කුසලතාවන්හි හත්වන මට්ටමට (NVQ 7) නොඅඩු මට්ටමක පරිගණක විද්‍යාව/ තොරතුරු තාක්ෂණ/ පරිගණක විද්‍යා හා තාක්ෂණ/ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ ප්‍රවීණතා/ නිපුණතා සහතිකයක් ලබා තිබීම.

හෝ

තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තිය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තිය කුසලතාවන්හි හයවන මට්ටමට (NVQ 6) නොඅඩු මට්ටමක පරිගණක විද්‍යාව/ තොරතුරු තාක්ෂණ/ පරිගණක විද්‍යා හා තාක්ෂණ/ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ ප්‍රවීණතා/ නිපුණතා සහතිකයක් ලබා තිබීම.

සහ

සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර පහක (05)ක පළපුරුද්දක් ලබා තිබීම.

හෝ

තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තිය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තිය කුසලතාවන්හි පස්වන මට්ටමට (NVQ 5) නොඅඩු මට්ටමක පරිගණක විද්‍යාව/ තොරතුරු තාක්ෂණ/ පරිගණක විද්‍යා හා තාක්ෂණ/ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ ප්‍රවීණතා/ නිපුණතා සහතිකයක් ලබා තිබීම.

සහ

සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර දහයක (10)ක පළපුරුද්දක් ලබා තිබීම.

**<u>වයස් සීමාව:</u>**

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය.

**වැටුප් පරිමාණය:**

JM 1-1 පියවර 02 රු. (72,650 - 10 x 1360 - 18 x 2,040 - 122,970) හි තබනු ලැබේ.

## 13. ශ්‍රවණවේදී කාර්මික ශිල්පී තනතුර

**සුදුසුකම:**

ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය 5 මට්ටමට (NVQ 5) නොඅඩු සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් මෙහෙයවනු ලබන පූර්ණකාලීන අවුරුදු දෙකක (02) න්‍යායාත්මක හා සීමාවාසික ශ්‍රවණවෙදී කාර්මික ශිල්පී ඩිප්ලෝමා පුහුණු පාඨමාලාව සමත්ව තිබීම අධ්‍යාපන පොදු සහතිකපත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන තුනක් (03) සහිතව විෂයයන් හයක් සමත් වී තිබීම.

සහ

ශ්‍රවණවේදී කාර්මික ශිල්පියෙකු ලෙස ශ්‍රී ලංකාව තුළ කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

**වයස් සීමාව:**

අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය.

**වැටුප් පරිමාණය:**

MA 2-1 පියවර 01 රු. (50,540 – (10 x 540 – 7 x 630 – 4 x 890 - 20 x 1,190 – 87,710) හි තබනු ලැබේ.

## 14. මධ්‍ය වත්ධ්‍යකෘත ඒකක ක්‍රියාකරු තනතුර

**සුදුසුකම්:**

අධ්‍යාපන පොදු සහතිකපත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන සාමාර්ථයන් තුනක් (03) සහිතව විෂයයන් හයක් (06) සමත් වී තිබීම

හෝ

තනතුරෙහි කාර්යභාරයට අදාළ වන යන්ත්‍ර/ සූත්‍ර ක්‍රියාත්මක කිරීම පිළිබඳ කාර්මික පුහුණුව සහිත තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාව (National Vocational Qualification - NVQ) දෙවැනි (02) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**වයස් සීමාව:**

අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය.

**වැටුප් පරිමාණය:**

PL 2 රු. (42,300 - 10 x 490 - 10 x 540 - 10 x 590 - 12 x 630 – 66,060)

*PL 2 පියවර 01 හි (රු.42,300/-) තබනු ලැබේ.

## 15. රෝහල් කාර්ය සහායක තනතුර

**සුදුසුකම්:**

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් ඇතුලුව විෂයන් හයක් සමත් වී තිබීම.

**වයස් සීමාව:**

අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය.

**වැටුප් පරිමාණය:**

PL 1 පියවර 01 රු. (40,500 – 450 x 10 – 490 x 10 – 540 x 07 – 590 x 15 - 62,530) හි තබනු ලැබේ.

## 16. අරක්කැමි තනතුර

**සුදුසුකම්:**

තනතුරෙහි කාර්යභාරයට අදාල විෂයන් යටතේ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාව 2 මට්ටමට (NVQ 2) නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**වයස් සීමාව:**

අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය.

**වැටුප් පරිමාණය:**

PL 2 පියවර 01 රු. (42,300 - 10 x 490 - 10 x 540 - 10 x 590 - 12 x 630 – 66,060) හි තබනු ලැබේ.

- **පැයට ගෙවීමේ පදනම මත**

## 1. වෛද්‍ය නිලධාරි

**1. වෛද්‍ය නිලධාරි - I ශ්‍රේණිය**

**සුදුසුකම්:**

වෛද්‍යවරයෙකු ලෙස සේවය කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ වලංගු පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම.

සහ

සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතනයක හෝ සෞඛ්‍ය අමාත්‍යාංශයේ පුද්ගලික වෛද්‍ය සේවා නියාමන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචිය ලබා ඇති, පුද්ගලික රෝහල්, සාත්තු නිවාස සහ මාතෘ නිවාස යන කාණ්ඩ යටතේ ක්‍රියාත්මක වන ආයතනවල II ශ්‍රේණිය වෛද්‍ය නිලධාරියෙකු ලෙස අවම වශයෙන් වසර හයක (06) පළපුරුද්ද ලබා තිබීම.

සහ

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් 11.10.2014 දින නිකුත් කරන ලද 1883/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ II වන ඇමුණුම යටතේ පිළිගත් පශ්චාත් වෛද්‍ය උපාධියක් ලබා තිබීම.

සහ

ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් නිකුත් කරන ලද "Certificate of Good Standing" ලබා තිබීම.

**2. වෛද්‍ය නිලධාරි - II ශ්‍රේණිය**

**සුදුසුකම්:**

වෛද්‍යවරයෙකු ලෙස සේවය කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ වලංගු පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම.

සහ

සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතනයක හෝ සෞඛ්‍ය අමාත්‍යාංශයේ පුද්ගලික වෛද්‍ය සේවා නියාමන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචිය ලබා ඇති පුද්ගලික රෝහල්, සාත්තු නිවාස සහ මාතෘ නිවාස යන කාණ්ඩ යටතේ ක්‍රියාත්මක වන රෝහලක අවම වශයෙන් වසර දෙකක (02) පළපුරුද්ද ලබා තිබීම.

සහ

ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් නිකුත් කරන ලද "Certificate of Good Standing" ලබා තිබීම.

**3. වෛද්‍ය නිලධාරි - ප්‍රාථමික ශ්‍රේණිය**

**සුදුසුකම්:**

වෛද්‍යවරයෙකු ලෙස සේවය කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ වලංගු පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම.

සහ

ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් නිකුත් කරන ලද "Certificate of Good Standing" ලබා තිබීම.

සැ. යු. වෛද්‍ය නිලධාරි (පැයට ගෙවීමේ පදනම මත) තනතුර වෙනුවෙන් එක් පැයක් සඳහා මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ 2025.03.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව ගෙවීම් සිදු කරනු ලැබේ.



Gazette.lk AMBITIONS REALIZED

## පොදු කොන්දේසි

සෑම අයදුම්කරුවෙකුම,

1. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

2. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම සෑම අපේක්ෂක/ අපේක්ෂිකාවක්ම ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහළෙහි හෝ පැන නගිනු ලබන හදිසි අවශ්‍යතාවයන් මත නම් කරනු ලබන ඕනෑම ස්ථානයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

3. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

4. සෑම අයදුම්කරුවෙකුම අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අයදුම් කරනු ලබන තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා තිබිය යුතුය.

5. ස්ථිර පදනම මත තනතුරු සඳහා සේවක අර්ථසාධක අරමුදල සඳහා ඔබගෙන් 10% දායකත්වයක්ද විශ්වවිද්‍යාලයෙන් 15% දායකත්වයක්ද දරණ අතර සේවක භාරකාර අරමුදල සඳහා විශ්වවිද්‍යාලයෙන් 3% දායකත්වයක් දරණු ලැබේ. (පාර්ලිමේන්තුව විසින් නීතිය මඟින් කරනු ලැබිය හැකි සංශෝධන වලට යටත්ව)

6. නිසි අයුරින් සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය සමඟින් සහතික කරන ලද අධ්‍යාපන, වෘත්තිය සහ සේවා සහතික වල ජායා පිටපත් ලියාපදිංචි තැපෑලෙන් **2026.10.25** දින හෝ එම දිනට පෙර **"විධායක අධ්‍යක්ෂ, විශ්වවිද්‍යාල රෝහල, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, වේරහැර"** යන ලිපිනයට යොමු කළ යුතු අතර, ලියුම්කවරයේ ඉහළ වම් කෙළවරෙහි අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.

7. අයදුම්කරුවන් කෙටි ලැයිස්තු ගත කිරීමේ අයිතිය ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල සතුවේ.

8. අසම්පූර්ණකළ ප්‍රමාද වී යොමුකරනු ලබන සහ ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල් ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

9. අයදුම්පත්‍ර භාගත කර ගැනීමට සහ වැඩි විස්තර සඳහා ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල වෙබ් අඩවියට පිවිසෙන්න.www.kdu.ac.lk / දුරකථන අංකය – 011 - 2044555.

**www.kdu.ac.lk**



Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED